සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: **06** | විෂයය / பாடம் / Subject: **පුරවැසි අධ්‍යාපනය** | පත්‍රය / வினாத்தாள் / Paper: **I, II** | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name ……………………………… විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ………………………

සැලකිය යුතුය

- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

---

## I කොටස

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. පාසලක ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයාගත හැකි මූලාශ්‍රය කුමක් ද?
    1. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වයස් ව්‍යුහය.
    2. ගුරු භවතුන්ගේ නාම ලේඛනය.
    3. පාසල් කාල සටහන.
    4. පාසලේ විවිධ ස්ථානවල තිබෙන සමරු ඵලක.

02. ශ්‍රී ලංකාවේ ඖෂධවල වෙළඳ නාමය වෙනුවට ඖෂධීය නාමය භාවිත කළයුතු බවට අවධාරණය කළ තැනැත්තා වන්නේ,
    1. මහාචාර්ය ප්‍රේමදාස උඩගම මහතාය.
    2. ජේ. ඊ. ජයසූරිය මහතාය.
    3. මහාචාර්ය සේනක බිබිලේ මහතාය.
    4. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාය.

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කීපයක් එක්වීමෙන් ගොඩනැගෙන පරිපාලන ඒකකය කුමක් ද?
    1. දිස්ත්‍රික්කය.
    2. පළාත.
    3. ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය.
    4. දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය.

04. සම්පත් අපතේයාම වැලැක්වීම නිසා ඇතිවන වාසිය කුමක් ද?
    1. පරිසරයට සිදුවන හානි අවම වීම.
    2. මුදල් අපතේ යාමක් සිදු වේ.
    3. අනාගත පරපුරට පරිහරණයට සම්පත් ඉතිරි නොවේ.
    4. නූතන පරිසරය දූෂණය වේ.

05. අතිශය නාගරික පරිසරයක් සහිත බල ප්‍රදේශය හඳුන්වනු ලබන්නේ,
    1. සුළු නගර සභාව යනුවෙනි.
    2. නගර සභාව යනුවෙනි.
    3. මහ නගර සභාව යනුවෙනි.
    4. ප්‍රාදේශීය සභාව යනුවෙනි.

අංක 6 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. යම් පුද්ගලයකු ඔහුගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් කර සකස් කරන පත්‍රිකාව ජීව දත්ත පත්‍රිකාවයි (...........)

07. සැලසුම් සහගතව ක්‍රියාකරන ශිෂ්‍යයා ක්‍රමාණුකූලව කටයුතු කරයි. (...........)

08. මිනිසාගේ බුද්ධිමය හැකියා හා කායික හැකියා දියුණු කර ගැනීමෙන් මානව සම්පතක් බවට පත්වේ. (...........)

09. අකාර්යක්ෂමව ක්‍රියා කිරීම අපට සේවා සපයන ආයතන වල යුතුකමකි. (...........)

10. සාරධර්ම වලට ගරු කිරීම විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කළයුතු ගුණාංගයකි. (...........)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

11. සැලසුම් සහගතව කටයුතු කරන ශිෂ්‍යයාට පහසුවෙන් ...................................... ජයගත හැක.

12. පොදු දේපල සුරැකීම නිසා ජනතාවට අත්‍යවශ්‍ය සේවා ...................................... සැපයීමට හැකිවේ.

13. කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක ...................................... පළාතට අයත්වේ.

14. අවමංගල්‍ය අවස්ථාවක මිනිසුන් ...................................... කටයුතු කරනු ලැබේ.

15. උප්පැන්න සහතිකයක් ලබා ගැනීමට ...................................... කාර්යාලයට යා යුතුය.

(යුතුකම්, අභියෝග, වයඹ, සාමූහිකව, කාර්යක්ෂමව, නිර්මාණාත්මකව, බස්නාහිර, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම්)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

16. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක ගණන ........................... කි.

17. අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම නිසා ජලය ........................... හේතුවේ.

18. ඔබේ ජීවිතයේ ........................... වැඩිදියුණු කරගතයුතු අතර දුබලතා අවම කරගත යුතුය.

19. පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබේ පාසලේ පවතින ........................... රැකගත යුතුය.

20. අප ප්‍රදේශයේ පවතින භෞතික ........................... ඵලදායීව භාවිත කරමු.

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්නග
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනික් එක් එක් ප්‍රශ්ණයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. i. ඔබ සතු හොඳ ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
    ii. පාසල් ලාංඡනය භාවිකරන අවස්ථා දෙකක් නම් කරන්න.
    iii. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක ලියා දක්වන්න.
    iv. හිරු එළියෙන් ලබාගන්නා ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
    v. ඔබ ප්‍රදේශයේ පවතින සමිති වර්ග කර දැක්විය හැකි ආකාර දෙකක් නම් කරන්න.
    vi. විදුලිය අපතේ යෑම වැලැක්වීමට ඔබට දායක වියයුතු අවස්ථා දෙකක් ලියා දක්වන්න.
    vii. පොදු දේපල වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
    viii. ඔබ සතු දක්ෂතාවක් හා දුබලතාවක් නම් කරන්න. (ලකුණු 2x8=16)

02. i. ඔබේ පාසල් සංස්කෘතියට අයත් අංග දෙකක් නම් කරන්න. (ලකුණු 2)
    ii. පාසල් අනන්‍යතාව පිලිබිඹුකරන සංකේත හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
    iii. පාසල් කොඩිය භාවිත කරන අවස්ථා දෙකක් සඳහන් කර කොඩිය ඔසවන අවස්ථාවල ප්‍රදර්ශනය කළයුතු ඉරියව් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

03. i. ඔබ පාසල අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම හා අංකය ලියා දක්වන්න. (ලකුණු 2)
    ii. ඔබ ප්‍රදේශයේ ජීවත්වන මානව සම්පත් හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
    iii. සාමූහිකව කටයුතු කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

04. i. භෞතික පරිසරයට අයත් ස්වභාවික නිර්මාණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)
    ii. ස්වභාවික පරිසරය තුළ කරන නිර්මාණ (නිර්මිත පරිසරය) හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
    iii. යහපත් පුරවැසියෙකු ලෙස පරිසරය සුරැකීමට ගත හැකි ක්‍රිය මාර්ග දෙකක් සඳහන් කර එය ක්‍රියාත්මක කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

05. i. ඔබ ප්‍රදේශයේ ජනතාව පිහිටුවාගෙන තිබෙන සමිති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
    ii. සිද්ධස්ථානයකින් සිදුවන සේවාවන් හතරක් නම් කරන්න. (ලකුණු 4)
    iii. පහත සඳහන් රාජ්‍ය සේවකයන්ගෙන් ගම්වාසීන්ට සිදුවන සේවාවක් ලියා දක්වන්න.
    A ග්‍රාම නිළධාරී
    B මහජන සෞඛ්‍ය පරීක්ෂක
    C සමෘද්ධි සංවර්ධන නිළධාරී
    D පවුල් සෞඛ්‍ය සේවිකාව
    E පොලිස් නිළධාරියා (ලකුණු 5)

06. i. පාසල් සංවිධාන ව්‍යුහය තුළ දැකිය හැකි සමිති දෙකක් නම් කරන්න. (ලකුණු 2)
    ii. පාසල් සිසුවකු ලෙස ඔබ සතු යුතුකම් හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)
    iii. ඔබ තුළ පවතින දුර්වලතා අවම කරගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග පහක් සඳහන් කරන්න. (ලකුණු 5)

07. i. ආචාරශීලී කථනයේ අංග ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)
    ii. සමාජයේ ක්‍රියාත්මක වන සරු දේවල් හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)
    iii. පහත සඳහන් පරිසර අංග දූෂණයට හේතුවන කරුණු එක බැගින් ලියා දක්වන්න. ඒවා කෙටියෙන් විස්තර කරන්න.
    A - ජලය B - ගොඩබිම (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | පිළිතුරු පත්‍රය

## I - කොටස

| අනු අංකය | පිළිතුර | අනු අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 04 | 11 | අභියෝග |
| 02 | 02 | 12 | කාර්යක්ෂමව |
| 03 | 01 | 13 | බස්නාහිර |
| 04 | 01 | 14 | සාමූහිකව |
| 05 | 03 | 15 | ප්‍රාදේශීය ලේකම් |
| 06 | √ | 16 | 25 |
| 07 | √ | 17 | දූෂණයට |
| 08 | √ | 18 | දක්ෂතා |
| 09 | x | 19 | සම්ප්‍රදායන් |
| 10 | √ | 20 | සම්පත් |

(මුළු ලකුණු 2×20=40)

## II - කොටස

01. i. කාරුණික බව, සත්‍යවාදීබව, අවංක බව, සතුට, විනයගරුකබව, සරල බව, ඉවසිලිමත් බව, අන් අයට ගරු කිරීම.

ii. නිල ඇඳුම සමග, පාසල් ලිපි ලේඛන වල, පාසල් ප්‍රකාශන වල, පාසලට අයත් හැඟවීම සඳහා, පාසලේ අනන්‍යතාව ඇඟවීම සඳහා

iii. පුත්තලම, කුරුණෑගල

iv. ආලෝකය, බලශක්තිය ආදී සුදුසු නිවැරදි පිළිතුරු දෙකකට ලකුණු ලබාදෙන්න.

v. රාජ්‍ය හා රාජ්‍ය නොවන නොවන සමිති, ස්වේච්ඡා සමිති

vi. පෙළ පොත 90 පිටුවේ පිළිතුරු වලින් දෙකකට ලකුණු ලබා ලබා දෙන්න.

vii.
- මහජන සුභසිද්ධිය සඳහා මානවයාට සේවා සැපයීම අරමුණු කරගෙන පවත්වාගෙන යාම.
- ලාභ අපේක්ෂාවෙන් තොරව රජය මගින් සපයා තිබීම.
- පොදුවේ සැමට පරිහරණය කළ හැකි වීම.

viii. සුදුසු පිළිතුරු වලට ලකුණු 02 ක් ලබා දෙන්න.

02. i. පාසලේ පවත්නා නීතිරීති, සම්ප්‍රදායන්, සිරිත් විරිත්, පාසල් අනන්‍යතාව පිලිඹිබු කරන සංකේත

ii. ආදර්ශ පාඨය, පාසල් ලාංඡනය, පාසල් කොඩිය, පාසල් ගීය

iii. පාසල් උදෑසන රැස්වීම, නිවාසාන්තර ක්‍රීඩා උළෙල, පාසලේ පැවැත්වෙන විශේෂ උත්සව වලදී, ප්‍රදර්ශනය කළයුතු ඉරියව් කෙටියෙන් විස්තර කිරීමට ලකුණු තුනක් ලබා දෙන්න.

03. i. සුදුසු නිවැරදි පිළිතුරට ලකුණු ලබාදෙන්න.
ii. වඩු කාර්මික, හෙද, ක්‍රීඩක, ගුරු, ගොවි, කම්කරු ආදී නිවැරදි පිළිතුරට ලකුණු ලබාදෙන්න.
iii. සුහදත්වය, පහසුව, සාර්ථකත්වය, කාලය ඉතිරිවේ. සමඟිය, මුදල් ඉතිරිය, සංස්කෘතිය සුරැකේ, සහෝදරත්වය වින්දනය ආදී

04. i. ගංගා, කඳු, මුහුදු වෙරළ, දියඇලි ආදිය
ii. ගොඩනැගිලි, මංමාවත්, නගර මන්දිර, විනෝද උද්‍යාන ක්‍රීඩාංගනය ආදී සුදුසු නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න.
iii. පෙළ පොත 98 පිටුවේ සඳහන් කරුණු 2 ක් ලියා විස්තර කිරීමට ලකුණු 5 ක් ලබාදෙන්න.

05. i. බෞද්ධ සමිති, ධීවර සමිති, ළමා සමිති, පෙළපොත 68 පිටුවේ සඳහන් සමිති 2 ක් නම් කිරීමට ලකුණු 2 ක් ලබාදෙන්න.
ii. පෙළ පොත 67 පිටුවේ සඳහන් කරුණු වලින් 4ක් නම් කිරිමට ලකුණු 4 ක් ලබාදෙන්න.
iii. පෙළ පොත 62 පිටුවේ සඳහන් පිළිතුරු වලට ලකුණු 5 ක් ලබා දෙන්න.

06. i. ක්‍රීඩාකමිටුව, සුභසාධන සමිතිය, ශිෂ්‍ය නායක මණ්ඩලය, පරිසල කමිටුව, ආගමික කමිටුව, විනය කමිටුව, බාල දක්ෂ කමිටුව, වෙනත් කමිටු
ii. පෙළ පොත 8 පිටුවේ සඳහන් කරුණු ලිවීමට ලකුණු 4 ක් ලබාදෙන්න.
iii. දුර්වලතා හඳුනාගැනීම, දුර්වලතා පෙන්වා දුන්විට පිළිගැනීම, දුර්වලතා අවම කරගැනීමට අධිෂ්ඨාන කර ගැනීම, දුර්වලතා මතු නොවන සේ ක්‍රියා කිරීම, දක්ෂතා මතු කර ගැනීමට ක්‍රියා කිරීම.

07. i.
- සංවරශීලීව කථාකරයි.
- නිවැරදි හා නිරවුල්ව අදහස් දක්වයි.
- අන් අයට ගෞරවයෙන් සලකයි.
- නිවැරදි ඉරියව්වල පිහිටා කථා කරයි. ආදී පෙළපොත් 73 පිටුවේ සඳහන් පිළිතුරු වලින් 2 ලිවීමට ලකුණු දෙන්න.

ii.
- අධ්‍යාපනයේ යෙදීම
- ආගම හැදෑරීම ඒ අනුව කටයුතු කිරීම
- නිරෝගි සෞඛ්‍ය සම්පන්න ජීවිත ගත කිරීම
- නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම ආදී පෙළ පොත 82 පිටුවේ සඳහන් පිළිතුරු 4 ක් ලිවීමට ලකුණු 4 ක් ලබා දෙන්න.

iii. ජලය අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම. වගා කටයුතු සඳහා අධික ලෙස පොහොර භාවිතය, කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය
ගොඩබිම අපද්‍රව්‍ය නිසිලෙස බැහැර කිරීම, වගා කටයුතු සඳහා රසායන භාවිතය, වනාන්තර විනාශ කිරීම. ඉහත කරුණු 2 ක් ලිවීමට ලකුණු 2 ක් හා විස්තර කිරීමට 3 ක ලබා දෙන්න.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: குடியியற்கல்வி – Civic Education | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: விடைகள்

## பகுதி - I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 06 | ✓ | 11 | சவால்கள் | 16 | 25 |
| 02 | 2 | 07 | ✓ | 12 | வினைத்திறன் | 17 | மாசு |
| 03 | 1 | 08 | ✓ | 13 | மேல் | 18 | திறன்களை |
| 04 | 1 | 09 | × | 14 | ஒருங்கிணைந்து | 19 | சம்பிரதாயங்களை |
| 05 | 3 | 10 | ✓ | 15 | பிரதேச செயலாளர் | 20 | வளங்கள் |

(40 புள்ளிகள்)

## பகுதி – II

(01) (i) கருணை, உண்மை, நேர்மை, மகிழ்ச்சி, பொறுமை, பிறரை மதித்தல்…..

(ii) சீருடையுடன், பாடசாலை ஆவணங்களில் போன்ற பொருத்தமான விடைகளுக்கு ….

(iii) புத்தளம், குருணாகல்

(iv) வெளிச்சம், வலுசக்தி போன்ற பொருத்தமான விடைகளுக்கு

(v) அரசாங்க , அரசாங்க சார்பற்ற சங்கங்கள், சுயேட்சை சங்கங்கள்

(vi) பொருத்தமா விடைகளுக்கு புள்ளியிடுக.

(vii) இலாப நோக்கமற்றதாக காணப்படும்.
பொதுவாக அனைவரது பயன்பாட்டிற்கும் உரியது…. போன்ற பொருத்தமான விடைக்கு

(viii) பொருத்தமான விடைக்கு புள்ளியிடுக.

($2 \times 8 = 16$ புள்ளிகள்)

(02) (i) பாடசாலை சட்டதிட்டங்கள், சம்பிரதாயங்கள், பழக்கவழக்கங்கள், பாடசாலையின் தனித்துவத்தை பேணும் அடையாளங்கள் (02 புள்ளிகள்)

(ii) மகுடவாசகம், பாடசாலை இலச்சினை, பாடசாலை கொடி, பாடசாலை கீதம்

(04 புள்ளிகள்)

(iii) பாடசாலை காலை கூட்டம், இல்ல விளையாட்டுப் போட்டி, பாடசாலையில் இடம்பெறும் விசேட விழாக்கள், கண்காட்சிகள் போன்ற பொருத்தமான விடைகளுக்கு…(05 புள்ளிகள்)

(03) (i) பொருத்தமான விடைக்கு புள்ளியிடுக. (02 புள்ளிகள்)

(ii) தாதி, விளையாட்டு வீரர், ஆசிரியர், விவசாயி, தொழிலாளி போன்ற பொருத்தமான விடைகளுக்கு…. (04 புள்ளிகள்)

(iii) ஒற்றுமை, எளிதாக செயற்படல், வினைத்திறன், காலம் விரயமாகாதிருத்தல், கலாசார பாதுகாப்பு, சகோதரத்துவம் போன்ற பொருத்தமான விடைகளுக்கு (05 புள்ளிகள்)

(04) (i) நதி, மலை, கடற்கரை,நீர்வீழ்ச்சி போன்ற பொருத்தமான விடைகளுக்கு (02 புள்ளிகள்)

(ii) கட்டடங்கள், வீதிகள், நகராட்சி மன்றங்கள், பூங்காக்கள் போன்ற பொருத்தமான விடைகளுக்கு… (04 புள்ளிகள்)

(iii) பாடநூலில் பக்கம் 107 இல் காணப்படும் காரணிகளில் இரண்டை எழுதி விளக்கியிருப்பின்… (05 புள்ளிகள்)

(05) (i) பௌதிக சங்கம், மீன்பிடிச்சங்கம், சிறுவர் சங்கம் போன்ற பொருத்தமான விடைகளுக்கு புள்ளியிடுக. (02 புள்ளிகள்)

(ii) பாடநூலில் பக்கம் 72இல் குறிப்பிடப்பட்டுள்ள காரணிகளில் நான்கினை எழுதியிருப்பின்.. (04 புள்ளிகள்)

(iii) பாடநூலில் 106 ம் பக்கத்தில் குறிப்பிடப்பட்டுள்ள காரணிகளை எழுதியிருப்பின் புள்ளியிடுக. (05 புள்ளிகள்)

(06) (i) விளையாட்டரங்கு, நலன்புரி சங்கம், மாணவத் தலைவர் குழு … போன்ற பொருத்தமான விடைகளுக்கு… (02 புள்ளிகள்)

(ii) பாடநூலில் பக்கம் 10 இல் குறிப்பிட்டுள்ள கடமைகளை எழுதியிருப்பின். (04 புள்ளிகள்)

(iii) பலவீனங்களை அறிந்து கொள்ளல், பலவீனங்களை குறைப்பதற்கு முயற்சித்தல், போன்ற மிகப் பொருத்தமான விடைகளுக்கு புள்ளியிடுக. (05 புள்ளிகள்)

(07) (i) அடக்கமாக உரையாடுவார். , பண்பான வார்த்தைகளைப் பயன்படுத்துவார். , பிறரை மரியாதையுடன் நடத்துவார். , சரியாகவும் தெளிவாகவம் கருத்துக்களை வெளியிடுவார். (02 புள்ளிகள்)

(ii) கல்வி கற்றல்., சமயத்தை பின்பற்றுதல், அதற்கேப் வாழ்தல்., ஆரொக்கியமான வாழ்வை வாழுதல், போன்ற பொருத்தமான விடைகளுக்கு புள்ளியிடுக. (04 புள்ளிகள்)

(iii) நீர் - கழிவுகளை நீரில் கலத்தல், பயிர்ச்செய்கைக்காக அதிகளவான உரம் பயன்படுத்துதல், இரசாயன உரங்களை பயன்படுத்துதல்.

நிலம் - கழிவுகளை இடுதல். பயிர்ச்செய்கைக்கு இரசாயன உரப் பயன்பாடு, காடழிப்பு போன்ற இரு காரணிகளை எழுதியிருப்பின் 2 புள்ளிகளும் விளக்கத்திற்கு 3 புள்ளிகளும் வழங்குக..


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න